මගේ අංකය : NYSC/ TVTD/TC.COM/2023

2023.11.02

ජාතික තරුණ සේවා සභාවේ,
සියළුම පළාත් අධ්‍යක්ෂවරුන්,
සියළුම මධ්‍යස්ථාන භාර නිලධාරීන් වෙත,

**ජාතික තරුණ සේවා සභාවේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල වාර්ෂිකව පාඨමාලා ක්‍රියාත්මක කිරීමේ කාලසටහන - 2024**

2024 වර්ෂයේ ජාතික තරුණ සේවා සභාව යටතේ ඇති සියළු වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබන කාලසටහන මේ සමඟ ඉදිරිපත් කර ඇත. උපදේශකවරුන් සහ අදාල කාර්ය මණ්ඩලය සහ අභ්‍යාසලාභීන් දැනුවත් කර පුහුණු මධ්‍යස්ථානයේ ඉදිරි වැඩකටයුතු කාලසටහනට අනුකූලව සිදුකරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

අධ්‍යක්ෂ (කා.වෘ.පු.),
ජාතික තරුණ සේවා සභාව,
මහරගම.

පිටපත් :

I. තරුණ සේවා අධ්‍යක්ෂ ජනරාල් /සභාපති - කා.දැ.පි.
II. අධ්‍යක්ෂ (පාලන/මුදල්/සංවර්ධන/ අභ්‍යන්තර විගණක) - කා.දැ.පි.
III. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන/කා.වෘ.පු./මුදල්/සංවර්ධන/විභාග හා ඇගයීම්) - කා.දැ.පි.

# ජාතික තරුණ සේවා සභාවේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල වාර්ෂික කාලසටහන -2024

| අනු අංක | කාරණය | වාර්ෂික පාඨමාලා | අර්ධ වාර්ෂික පාඨමාලා ප්‍රථම අධ්‍යයන වාරය | අර්ධ වාර්ෂික පාඨමාලා දෙවන අධ්‍යයන වාරය |
|---|---|---|---|---|
| | | **2024 ජනවාරි-දෙසැම්බර්** | **2024 ජනවාරි-ජූනි** | **2024 ජූලි-දෙසැම්බර්** |
| 1. | ප්‍රචාරක කටයුතු සිදුකිරීම | 2023.11.01 සිට 12.31 දක්වා | 2023.11.01 සිට 12.31 දක්වා | 2024.06.01 සිට 06.30 දක්වා |
| 2. | අයදුම් පත්‍ර කැඳවීම , සම්මුඛ පරීක්ෂණයෙන් අභ්‍යාසලාභීන් තෝරා ගැනීම සහ ලියාපදිංචි කිරීම | 2023.12.01 සිට 12.31 දක්වා | 2023.12.01 සිට 12.31 දක්වා | 2024.06.01 සිට 2024.06.30 දක්වා |
| 3. | පාඨමාලා ආරම්භ කිරීම හා දෙමව්පිය හමුව | 2024.01.01 | 2024.01.01 | 2024.07.06 |
| 4. | සමාජානුයෝජනය හා ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 2024.01.06 සිට 01.12 දක්වා | 2024.01.06 සිට 01.12 දක්වා | 2024.07.07 සිට 07.14 දක්වා |
| 5. | පුහුණු ද්‍රව්‍ය ලබාදීම | 2024.01.31 සිට 02.28 දක්වා | 2024.01.31 සිට 02.28 දක්වා | 2024.07.15 සිට 08.15 දක්වා |
| 6. | අළුත් අවුරුදු නිවාඩු | 2024.04.08 සිට 17 දක්වා | 2024.04.08 සිට 17 දක්වා | - |
| 7. | අළුත් අවුරුදු නිවාඩුවෙන් පසු නැවත පාඨමාලා ආරම්භ කරන දිනය | 2024.04.18 | 2024.04.18 | - |
| 8. | ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාව | පුහුණු කාලසීමාව ඇතුලත. | පුහුණු කාලසීමාව ඇතුලත. | පුහුණු කාලසීමාව ඇතුලත. |
| 9. | ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම | 2024.12.10 සිට 22 දක්වා | 2024.06.11 සිට 21 දක්වා | 2024.12.10 සිට 22 දක්වා |
| 10. | අධ්‍යන වර්ෂ අවසාන විභාගය | 2024.12.19 සිට 31 දක්වා | 2024.06.20 සිට 30 දක්වා | 2024.12.19 සිට 31 දක්වා |
| 11. | අඛණ්ඩ ඇගයීම් පැවැත්වීම | පුහුණු කාලසීමාව ඇතුලත. | පුහුණු කාලසීමාව ඇතුලත. | පුහුණු කාලසීමාව ඇතුලත. |
| 12. | NVQ පාඨමාලා සඳහා TVEC ආයතනයෙන් පැවැත්වෙන පරීක්ෂණ හා රැකියාගත පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් යොමුකිරීම. | 2025 ජනවාරි තෙවන සති අන්තය | 2024 ජූලි තෙවන සති අන්තය | 2025 ජනවාරි තෙවන සති අන්තය |

* ඉගැන්වීම් වේලාව:- පෙ.ව. 8.30 - ප.ව. 4.00

* දිවා විවේකය:- පැය 1/2* වැඩහල්/පන්ති කාමර පිරිසිදු කිරීම:- ප.ව. 4.00 – 4.15

වැදගත් :-

01. පූර්ණ කාලීන NVQ සයමාසික හා වාර්ෂික පාඨමාලා ක්‍රියාත්මක කිරීමේදී ජාතික නිපුණතා සම්මතයන් හා විෂය නිර්දේශයන්ට අනුව වෙන්කර ඇති කාලසීමාව අනිවාර්යයෙන්ම ආවරණය කල යුතු අතර දිනකට පැය 06 බැගින් පාඨමාලා මෙහෙයවමින් නියමිත කාලසීමා ආවරණය කිරීමට අපහසුවන පාඨමාලා දිනකට පැය 07 බැගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල යුතු අතර එලෙසද පාඨමාලා කාලය ආවරණය කල නොහැකි වුවහොත් සති අන්ත දිනයන්හිදී හෝ පුහුණු කටයුතු සිදුකර නියමිත කාලසීමාව ආවරණය කිරීමට උපදේශකවරුන් හා මධ්‍යස්ථාන භාර නිලධාරීවරුන් කටයුතු කල යුතු වේ.

02. භෞතික ප්‍රගතිය ඉදිරිපත් කිරීමේ දී සෑම මසකම 05 වන දිනට ප්‍රථම පසුගිය මසට අදාලව අභ්‍යාසලාභීන් බදවා ගැනීම හෝ හැරයාම් වේ නම් කළමණාකරන තොරතුරු පද්ධතිය (MIS) යාවත්කාලී කර නිවැරදි දත්ත ඇතුලත් කල යුතු අතර සෑම මසකම අදාල භෞතික ප්‍රගතිය ආසන්නතම ඉදිරි මාසයේ 07 වන දින වන

විට කළමණාකරන තොරතුරු පද්ධතිය (MIS) මගින් කාර්මික හා වෘත්තීය පුහුණු අංශයට ලබාගන්නා බැවින් එය යාවත්කාලීනව පවත්වාගෙන යාම මධ්‍යස්ථාන භාර නිලධාරීවරයාගේ වගකීමක් වේ.

03. පුහුණු මධ්‍යස්ථානවල පාඨමාලා හදාරන අභ්‍යාසලාභීන්ගේ දෙමාපිය හමුවක් සෑම අධ්‍යයනවාරයක් සඳහාම සංවිධානය කිරීමට වගබලාගත යුතු අතර දෙමව්පිය හමුවේදී ඉදිරිපත් කරනු ලබන යෝජනා සඳහා ක්‍රියාත්මක කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් ඇතුලත් ගොනුවක් පවත්වාගෙන යා යුතුය.

04. අභ්‍යාසලාභීන්ගේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව සංවිධානය කිරීමේදී පූර්ණ කාලීන, NVQ ,සයමාසික හා වාර්ෂික පාඨමාලා ජාතික නිපුණතා සම්මතයන් හා විෂය නිර්දේශයන්ට අනුව නිර්දේශිත වූ පුහුණු පාඨමාලා සඳහා පමණක් ක්ෂේත්‍රය ආවරණය වන පරිදි සුදුසු ආයතන හා ස්ථාන තෝරා ගෙන ක්ෂේත්‍ර චාරිකාව සංවිධානය කළ යුතු අතර පළාත් අධ්‍යක්ෂ ගේ අනුමැතිය ලබාගැනීම ප්‍රමාණවත් වේ. අධ්‍යන චාරිකාව යාමට ප්‍රථම අනුමැතිය ලබාගත යුතු අතර ක්ෂේත්‍ර චාරිකාව අවසානයේ එහි ප්‍රගතිය කාර්මික හා වෘත්තීය පුහුණු අංශය වෙත ඉදිරිපත් කල යුතුය.

05. පුහුණු අභ්‍යාසලාභීන්ගේ දෛනික වාර්තා පොත් උපදේශකවරයා පරීක්ෂා කිරීමෙන් අනතුරුව මධ්‍යස්ථාන භාර නිලධාරී විසින් පරීක්ෂා කිරීම සිදුකල යුතු අතර උපදේශකවරුන්ගේ දෛනික ඉගැන්වීමේ සටහන් පොත් සතිපතා පරීක්ෂා කිරීම ද මධ්‍යස්ථාන භාර නිලධාරී විසින් සිදුකල යුතු වේ.

06. සෑම අධ්‍යයන වාරයක් සඳහාම ඒ ඒ පාඨමාලා මට්ටමින් කාර්මික හා වෘත්තීය පුහුණු අංශය මගින් අනුමත කර ඇති අභ්‍යන්තර හා භාණ්ඩාගාර ප්‍රතිපාදන සීමාවන්ට අදාලව පුහුණු ද්‍රව්‍ය පාඨමාලාව ආරම්භයේ දී මිලදී ගැනීමට කටයුතු කළයුතු අතර පාඨමාලා ද්‍රව්‍ය නිකුත් කිරීම පිළිබඳව ලේඛණයක් පවත්වාගෙන යා යුතුය. භාණ්ඩාගාර ප්‍රතිපාදන හා 13 වසරක සහතික කළ අධ්‍යාපන වැඩසටහන යටතේ ලබාදෙනු ලබන ප්‍රතිපාදන තුලින් පුහුණු ද්‍රව්‍ය සඳහා වැය දැරීම් කල හැකි වන්නේ පූර්ණකාලීන පාඨමාලා සඳහා පමණි.

| | | | |
|---|---|---|---|
| සකස් කළේ :- | පරීක්ෂා කළේ :- | නිර්දේශ කළේ :- | නිර්දේශ කළේ :- |
| ........................ | ........................ | ........................ | ........................ |
| ස.ත.සේ.නි, | කළමණාකරු(කා.වෘ.පු), | සහකාර අධ්‍යක්ෂ(කා.වෘ.පු), | නියෝජ්‍ය අධ්‍යක්ෂ(කා.වෘ.පු), |
| ජාතික තරුණසේවා සභාව. | ජාතික තරුණසේවා සභාව. | ජාතික තරුණසේවා සභාව. | ජාතික තරුණසේවා සභාව. |
| 2023.11.02 | 2023.11. .02 | 2023.11.02 | 2023.11. |

අනුමත කළේ :-

........................

අධ්‍යක්ෂ(කා.වෘ.පු),
ජාතික තරුණසේවා සභාව.
2023.11. 03